රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 30/95

මගේ අංකය: 11/309 ර් 101
ආයතන අංශය,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07

1995.10.30

සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ඌණ සේවා නියුක්ත උපාධිධාරීන්ට සහන සැලසීම සඳහා නිකුත් කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/94 අනුව ඉහල වැටුප් ලද නිලධාරීන් පැරණි තනතුරුවල තවදුරටත් සේවය කරන හෙයින් ඔවුන්ට අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම.**

ලිපිකරු හා සමාන්තර සේවාවන්හි සේවය කරමින් සිටියදී 1994.06.15 දිනැති අංක 20/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් ඉහල වැටුප් පරිමාණයක පිහිටුවනු ලැබූ උපාධිධාරීන් සුදුසු වෙනත් තනතුරුවලට පත් කරනතුරු පැරණි තනතුරුවලම තවදුරටත් සේවයෙහි නිරතවීමට ඉඩ දෙනු ලැබ තිබේ.

02. එවන් නිලධාරීන් සිය නිත්‍ය රාජකාරි වේලාවනට අමතරව සේවය කරන්නේ නම් ඔවුන් දරණ තනතුරුවලට අදල වන අතිකාල දීමනා ගෙවීමේ සූත්‍ර පදනම් කොට ගෙන අතිකාල ගණන් බලා ගෙවිය යුතුය. මෙම විධිවිධාන 1995 අගෝස්තු මස 16 වන දින සිට ක්‍රියාත්මක වනු ඇත.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය